# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 972/14 – 1997 අප්‍රේල් 25 වැනි සිකුරාදා – 1997.04.25

972/14 ஆம் இலக்கம் – 1997 ஆம் ஆண்டு ஏப்பிறல் மாதம் 25 ஆம் திகதி வெள்ளிக்கிழமை

No. 972/14 – FRIDAY, APRIL 25, 1997

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.– බී. 4/96.

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

ඉන්දික ගුණවර්ධන,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1997 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1997 මසුන් පරිහරණය කිරීමේ සහ බෙදා හැරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) නියමිත මසුන් විකිණීම, ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ වෙන්දේසි කිරීම සඳහා යොදා ගන්නා වූ අලෙවි පොල, ගබඩා ගුදම, වෙන්දේසි පොල හෝ වෙනත් ස්ථානවල පොලොව සහ බිත්ති ජලවාරක තත්ත්වයෙන් තිබිය යුතුය.

(2) එවැනි අලෙවි පොලක, ගබඩා ගුදමක හෝ වෙන්දේසි පොලක යොදවා ගනු ලබන සියලු පිරිස් හෝ සේවකයන් සඳහා සේදීමට සහ බීමට ප්‍රමාණවත් සහ අඛණ්ඩ ජල සැපයුමක් තිබිය යුතු අතර, ඔවුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ද සැපයිය යුතුය.

3. අලෙවිය හෝ වෙන්දේසිය සඳහා තබා ඇති මසුන් –

(අ) කෘමීන්ගෙන් සහ සතුන්ගෙන් ආරක්ෂා විය යුතුය;

(ආ) පස්, වැලි, සෙවල හෝ වෙනත් දූෂක ද්‍රව්‍යවලින් නිදහස් ව තිබිය යුතුය;

(ඇ) හිරු එළියෙන්, වැස්සෙන්, දූවිල්ලෙන් සහ වෙනත් දූෂක ද්‍රව්‍යවලින් ආවරණය කර තිබිය යුතුය.

4. මසුන් බෑම, ගොඩබෑම, තබා ගැනීම, ගබඩා කිරීම හෝ ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලබන සියළුම උපකරණ සහ මසුන් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන කිසියම් ලෑල්ලක් වේනම් එය ද ඉතා හොඳ තත්ත්වයෙන් හා පිරිසිදුව තබා ගත යුතුය.

I A – D 044796 – 1,960 (97/04)

5. බොකු, කරමළ සහ අන්තරාංග වැනි අපතේ හරින සියලු ද්‍රව්‍ය කිසියම් අලෙවි පොළක, ගබඩා ගුදමක, වෙන්දේසි පොළක හෝ වෙළඳාම පිණිස තබන වෙනත් ස්ථානයක ඇතුළත හෝ අසලක නොදැමිය යුතු අතර මෙම ස්ථානවල උසස් පිරිසිදු බව සහ ස්වස්ථතාව ආරක්‍ෂාවන පරිදි හැකිතරම් ඉක්මනින් ඉවත් කළ යුතුය.

6. මසුන් නරක්වීම සහ කුණුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය උෂ්ණත්වයකින් තොරව මසුන් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, වෙන්දේසි කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

එල්.ඩී – බී. 4/96.

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඉන්දික ගුණවර්ධන,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1997 මාර්තු මස 05 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග, 1997 මසුන් සැකසීමේ ආයතන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් මසුන් සැකසුම් ආයතනයක් පවත්වා ගෙන නොයා යුතුය.

3. 2 වන නියෝගයෙහි දැක්වෙන බලපත්‍රය ලබාගැනීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මෙහි උපලේඛනයෙහි දැක්වෙන "අ" ආකෘති පත්‍රය මගින් රුපියල් එක් දහසක ගාස්තුවක් ද සමග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර අදාල නිෂ්පාදිතය සැකසීම සම්බන්ධයෙන් ගැසට් කරන ලද සහතික සලකුණ භාවිතා කිරීම සඳහා 1948 අංක 6 දරන පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් එම තැනැත්තා වෙත නිකුත් කරන ලද බලපත්‍රය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (ප) වගන්තිය යටතේ ගැසට් නිවේදනයක් මගින් පළ කරන ලද, පරිසර කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලැබූ ව්‍යාපෘති අනුමත කිරීමේ ඒජන්සි ආයතනයේ අනුමැතිය ද, ඒ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

4. 3 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් සඳහා නිකුත් කරනු ලබන්නා වූ සෑම බලපත්‍රයක් ම මෙහි උපලේඛනයෙහි දැක්වෙන "ආ" ආකෘති පත්‍රය මගින් නිකුත් කළ යුතු අතර, කලින් අවලංගු කොට නොමැති නම් මිස, එය නිකුත් කළ දින සිට එක් වසරක් සඳහා වලංගු වනු ඇත. තවද, එහි දැක්වෙන නියෝග හා කොන්දේසිවලට ද යටත් වනු ඇත.

5. අධ්‍යක්ෂවරයා විසින් 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් –

(අ) එම බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් බලපත්‍රහිමියා විසින් උල්ලංඝනය කරන ලද බවට;

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් එම බලපත්‍රලාභියා වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කර ඇති බවට; හෝ

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ වූ අදාල ඒජන්සි ආයතනය විසින් නිකුත් කරන ලද අනුමැතිය අවලංගු කර ඇති බවට සෑහීමට පත් වුවහොත් එම බලපත්‍රය, ප්‍රත්‍යාදිෂ්ඨ කළ හැකිය.

6. මේ නියෝගවල –

"මසුන් සැකසීමේ ආයතනය" යන්නෙන්, මසුන් සාදනු ලබන, සකසනු ලබන, ඇසුරුම් කරනු ලබන, අධිශීත කරනු ලබන හෝ ගබඩා කරනු ලබන ස්ථානයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය" යන්නෙන් 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

උපලේඛනය

3 වන නියෝගය.

"අ" ආකෘතිය

මසුන් සැකසීමේ ආයතනයක් මෙහෙයවීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරුගේ නම :______________.

2. ලිපිනය :______________. දුරකථන/ෆැක්ස් අංකය :______________.

3. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය :______________.

4. මසුන් සැකසීමේ ආයතනය පිහිටි ස්ථානය :______________.

5. සකසනු ලබන මසුන් වර්ගය සහ සැකසීමේ ක්‍රමය :

| මසුන් වර්ගය | සැකසීමේ ක්‍රමය |
|---|---|
| | |

6. වාර්ෂික මුළු ධාරිතාව :______________.

7. එක් එක් මසුන් වර්ගය සම්බන්ධයෙන් අමුද්‍රව්‍ය ලබා ගන්නා මාර්ගය :______________.

8. එක් එක් මසුන් වර්ගය සම්බන්ධයෙන් නිමි නිෂ්පාදිත සඳහා ඉලක්ක කොට ඇති වෙළඳපොළ :______________.

9. කාර්ය මණ්ඩලය විස්තර :

| වර්ගය | සේවයෙහි යොදවා ඇති සේවක ප්‍රමාණය |
|---|---|
| | |

10. අදාළ වෙනත් තොරතුරු :______________.

මා විසින් ඉහත සඳහන් කරන ලද කරුණු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. මා විසින් මෙහි සඳහන් කොට ඇති තොරතුරු අසත්‍ය හා සාවද්‍ය බව හෙළි වුවහොත් මාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කළ හැකි බව සහ බලපත්‍රය නිකුත් කිරීමෙන් පසුව හෙළිදරව් වුවහොත් එය අවලංගු කරනු ලැබිය හැකි බවට ද මම එකඟ වෙමි.

________________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :______________.

4 වන නියෝගය.

"ආ" ආකෘතිය

මසුන් සැකසීමේ ආයතනයක් මෙහෙයවීම පිණිස බලපත්‍රය

බලපත්‍ර අංකය :______________.

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ .................................. යන ස්ථානයේ, මෙහි පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත්ව, මසුන් සැකසීමේ ආයතනයක් මෙහෙයවීම සඳහා.................................................. ස්ථානයේ පදිංචි .................................................................. යනු අයට බලය දෙනු ලැබේ :–

1. මෙම බලපත්‍රය, කලින් අවලංගු නොකරන ලද නම්, නිකුත් කළ දින සිට එක් වසරක් සඳහා වලංගු වේ.

2. මෙම මසුන් සැකසීමේ ආයතනය වෙත, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලැබුවා වූ ලියාපදිංචි සහතිකය හෝ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කරනු ලැබුවා වූ පාරිසරික ආරක්ෂක බලපත්‍රය අවලංගු කිරීම හේතුකොටගෙන, මෙම බලපත්‍රය අවලංගු වනු ඇත.

3. මෙම බලපත්‍රලාභියා විසින්, ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ නිලධාරියෙකුට හෝ වෙනත් අයෙකුට පරීක්ෂණ කටයුතු සඳහා මසුන් සැකසීමේ ආයතනයේ පරිශ්‍රයට ඇතුල්වීමට ඉඩ සැලසිය යුතු ය.

________________,
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ.

දිනය :______________.

05 –83